# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපායසඩ , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 2015/2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024
දිනය / திகதி / Date — 23/07/2024 පැය 1340

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.07.22 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 51 | - | බුලි 01<br>යකඩ බැරල් 01<br>තඹ දඟර 01<br>ගෑස් ලිප් 01<br>ගෑස් සිලින්ඩර් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. බලපත්‍ර නොමැතිව දැව කඳන් තොගයක් සමඟ සැකකරුන් සිව්දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර**

2024.07.22 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ මොරණරාගල පොලිස් වසමේ ටැම්වත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව තේක්ක දැව කඳන් 148 ක් ලොරි රථයකට පටවමින් සිටි සැකකරුවන් සිව්දෙනෙකු අත්අඩංගුවට ගෙන මොණරාගල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 26 හා 48 වයස් වල පසුවන මොණරාගල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. මොණරාගල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.**

**03.** **කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරුගම්බේ කඳවුර.**

2024.07.22 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරුගම්බේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පොතුවිල් පොලිස් වසමේ පසරච්චේන ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර කේරළ ගංජා කිලෝ 01 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පොතුවිල් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 64 ක් වූ පොතුවිල් 19 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04.** **දිය අනතුරකට පත් වූ විදේශීය ජාතිකයෙකු බේරා ගැනීමක් - පොලිස් විශේෂ කාර්ය බලකා ආරුගම්බේ කඳවුර.**

2024.07.22 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ආරුගම්බේ ජීවිතාරක්ෂක කණ්ඩායමේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ආරුගම්බේ මුහුදු තීරයේ දිය අනතුරකට පත් විදේශීය ජාතිකයෙකු බේරාගෙන මූලික ප්‍රථිකාර ලබාදීමට කටයුතු සිදු කර ඇත.

තවද, වෛද්‍ය උපදෙස් ලබා ගන්නා ලෙස දන්වා ඔහුගේ බිරිඳට භාර දීමට කටයුතු කර ඇති අතර මොහු වයස අවුරුදු 49 ක් වූ ස්විඩන් ජාතිකයෙකු බවට අනාවරණය වී ඇත.

**05.** **බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකින් වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුවරසන්කුලම් කඳවුර**

2024.07.22 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුවරසන්කුලම් කඳවුරේ නිලධාරින් විසින් මඩු පොලිස් වසමේ මරදමඩු ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකින් වැලි ප්‍රවානහය කරමින් සිටි ට්‍රැක්ටර් රථයද සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මඩු පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වූ සෝදි නගර් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** මඩු පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06.** **බලපත්‍ර නොමැතිව රක්ෂිතයක භූමි ප්‍රමාණයක් එලි පෙහෙලි කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම කඳවුර**

2024.07.22 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම කඳවුරේ නිලධාරින් විසින් සෙට්ටිකුලම පොලිස් වසමේ මොහාන්තාන්කුලම් ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මොහාන්තාන්කුලම් රක්ෂිත ප්‍රදේශයේ අක්කර 02 පමණ භූමි ප්‍රමාණයක් එලි පෙහෙලි කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන සෙට්ටිකුලම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 39 හා 53 වයස් වල පසුවන නෙරියකුලම් ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. සෙට්ටිකුලම** පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**07. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගල්දූව උප කඳවුර**

2024.07.22 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගල්දූව උප කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අම්බලන්ගොඩ පොලිස් වසමේ ඌරවත්ත පාලම ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 18 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අම්බලන්ගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වූ අම්බලන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකාරුවෙකි.** අම්බලන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**